# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/24 – 2019 අප්‍රේල් 03 වැනි බදාදා – 2019.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඔඑම්/01/2016/181.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ආර්. ජී. සුනිල් සමරවික්‍රම මයා ඇතුළු සේවකයින් 23 දෙනා, අංක 72, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/01/2016/181.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්;*

ආර්. ජී. සුනිල් සමරවික්‍රම මයා ඇතුළු සේවකයින් 23 දෙනා, අංක 72, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්;*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැලසුම් හා සැසඳුම් සමීක්ෂණ ලිපිකරු තනතුරේ 2006 වසරේ සිට වැඩ බැලීමේ පදනමින් සේවයේ නියුතු ආර්. ජී. එස්. සමරවික්‍රම මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 23 දෙනා එම තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න'' පිළිබඳව වේ.

1. ආර්. ජී. එස්. සමරවික්‍රම
2. ආර්. ජී. ප්‍රියන්ත
3. ඒ. ඩී. රාජපක්ෂ
4. ඒ. ඩී. ඒ. එන්. කරුණාතිලක
5. ඒ. ඒ. සලීම්
6. එම්. බී. ඉස්මාලෙබ්බෙ
7. ආර්. ජී. ආර්. අයි. ආරියසිංහ
8. එච්. ඒ. ඒ. එන්. රුදිගු
9. එන්. එල්. ජයරත්න
10. පී. ඩී. බී. ඒ. විමලසේන
11. කේ. එම්. එස්. කේ. වික්‍රමසිංහ
12. කේ. එල්. පී. කොඩිතුවක්කු
13. ඒ. එල්. ජිෆ්රි
14. ඕ. ඩබ්ලිව්. පී. බී. චන්සේකර
15. ඒ. පී. පී. පත්මසිරි
16. ඩී. ජේ. සී. දේවසුරේන්ද්‍ර
17. පී. ජේ. ප්‍රදීප්
18. කේ. එල්. එන්. රෝහණ
19. ටී. ජී. එච්. සිල්වා
20. ඒ. යූ. නිරෝෂන්
21. එස්. සී. ඩී. ඩයස්
22. ආර්. ජී. ඩී. සත්කුමාර
23. ජී. එම්. එස්. බී. රත්නායක

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 572

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.